# Abstract No 95

## කව්සිළුමිණේ වර්ණනාවලට කාව්‍යාදර්ශයේ ඍජු බලපෑම පිළිබඳ විමර්ශනයක්

ඩබ්. ඒ. ඩබ්. සුභාෂිණී වේරගොඩ

සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

සිංහල කාව්‍යය සාහිත්‍යයේ පෝෂණයට සංස්කෘත කාව්‍යය සාහිත්‍යයේ බලපෑම නිරන්තරයෙන් ලැබිණි. සංස්කෘත අලංකාරවාදයේ බලපෑම නිසා අර්ථවත් ගී කාව්‍යය නිර්මාණය විය. අලංකාරවාදී චින්තනයේ පුරෝගාමියා වූ භාමහ මහාකාව්‍යයක අන්තර්ගත විය යුතු ලක්ෂණ පෘථුල ලෙස සාකච්ඡා කොට ඇත. කව්සිළුමිණ මහාකාව්‍යය සම්භාව්‍ය සංස්කෘත සාහිත්‍යයේ පසුකාලීන උසස් මහාකාව්‍යය හා සමතැන් ගැනීමට සමත් වූයේ කාව්‍යාදර්ශයේ පරිශීලනය ඍජු ව බලපෑ බැවිනි. කව්සිළුමිණේ අන්තර්ගත වන්නේ ජාතක කතා සංග්‍රහයේ එන කුස කතාවයි. කතුවරයාගේ පරමාර්ථය සංස්කෘත මහාකාව්‍යය නීති රීතිවලට අනුකූල වෙමින් රසභාව ජනනය කෙරෙන පරිදි මේ කතාව රචනා කිරීමයි. කව්සිළුමිණේ පරමාර්ථය සෞන්දර්යාත්මකය. එමනිසා මෙම කාව්‍යය කෙරෙහි සංස්කෘත කාව්‍ය විචාර සංකල්ප බලපෑ ආකාරය විමර්ශනය කළ විට ඒ සඳහා වඩාත් ම පාදක වී ඇත්තේ අලංකාරවාදයයි. කාව්‍යයේ මුඛ්‍ය රසය ශෘංගාරය වූ බැවින් ශෘංගාරය උද්දීපනය කිරීම සඳහා ද කවියාට අලංකාරවාදය උපයෝගී කර ගැනීමට සිදු ව ඇත. එමනිසා අලංකාරවාදී කාව්‍යය විචාරයේ සෑම ලක්ෂණයක් ම පාහේ කව්සිළුමිණේ සෑම වර්ණනාවකම දක්නට ලැබේ. මෙම වර්ණනාවල සංකල්පනා මාලාව හා කාව්‍යය සංකල්ප කාව්‍යාර්ර්ශයට වඩා වෙනස් වන්නේ මඳ වශයෙනි. මෙම පර්යේෂණයේ මා පැහැදිලි කිරීමට උත්සාහ දරන්නේ කව්සිළුමිණ මහාකාව්‍යයට කාව්‍යාදර්ශය බලපා ඇති ආකාරය පිළිබඳවයි.

ප්‍රමුඛ පද : කව්සිළුමිණ, කාව්‍යාදර්ශය, මහාකාව්‍යය, සංස්කෘත